**IPRC/16/151**

# පාසල් නිල විෂයමාලව ප්‍රායෝගිකත්වයට නැගීමෙහි දී ඇතිවන ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

විමලධම්ම එම්පේ[1*], සොභිත කාරාපික්කාඩ[1]

පාසල් විෂයමාලාවෙහි අන්තර්ගත කරුණු ප්‍රායෝගිකත්වයට නැගීමෙහිලා යම් යම් දුර්වලතා පවතින බව හැගීයයි. සිසුන්ගේ හැසිරීම් අධ්‍යයනය කිරීමෙන් චරිතායන අධ්‍යාපනය තවදුරටත් සංවර්ධනය විය යුතු මට්ටමක පවතින බව පැහැදිලිය. පාසල හා ඉන් පරිබාහිරව සිසුන් තුළ පවතින සමාජානුයොජනය නොවූ හැසිරීම් පාසල හා සමාජයට පද්ධතියක් ලෙස ගැටලු ඇති කර වන මට්ටම දක්වා වර්ධනය වී ඇත. පාසල් නිල විෂයමාලාව තුළින් යහපත පුරවැසියන් බිහිකර ගැනීම දිගුකාලීන පරමාර්ථය වේ. එකී පරමාර්ථ උදෙසා සියලු විෂයයන්ගෙන් උත්සාහ දරනු ලැබේ. එහි දී බුද්ධ ධර්මය විෂය සදචාරාත්මක බව ඇති කිරීමට ප්‍රමුඛ දයකත්වයක් සපයන බව එහි අරමුණු හා නිපුනතාවලින් ගම්‍ය වේ. උක්ත කරුණු අධ්‍යයනය සදහා ශ්‍රි ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්ක දෙකක 1 සී වර්ගයේ පාසල් දෙකක උදූසන ආගමික වතාවත් ඇසුරින් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයකි. ඒ සදහා ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ හා ලේඛණගත දත්ත යොදා ගන්නා ලදී. තොරතුරුවල නිරවද්‍යතාව හා විශ්වස්‍යතාව ආරක්ෂා කිරීම සඳහා දත්ත ත්‍රිකෝණිකරණය කරන ලදී. එහි දී පහත සදහන් අනාවරණයන් වඩාත් සුවිශේෂී විය. සිසුන්ගේ චරිත සංවර්ධනය සදහා සියලු ගුරුවරුන්ගේ අවධානය නොමදව ලැබිය යුතු අතර එය විනය භාර ආචාර්යවරුන්ට පමණක් භාරකිරීම සුදුසු නොවන බවත් යහපත් සමාජානුයොජනය සඳහා දැනුම පමණක් ලබාදීම ප්‍රමාණවත් නොවන අතර ප්‍රායෝගිකව ක්‍රියාකාරකම්වල යෙදවීම අත්‍යවශ්‍ය වී ඇත. සිසු ආකල්ප වර්ධනය වීමට එය බෙහෙවින් බලපානු ඇත. සදචාරාත්මක වර්ධනය කෙරෙහි නිවසෙහි පවතින පරිසරය හා සංස්කෘතිය බෙහෙවින් බලපාන අතර එය සිදු වන්නේ සීමිත සිසු පිරිසක් සදහා පමණි. ඒ නිසා නිල විෂයමාලාවේ අන්තර්ගතය ප්‍රායෝගිකත්වයට නැගීමට නිවසින් ද වැඩි දයකත්වයක් ලබාදීම ඉතා වැදගත්ය. සමාජයේ සෘණාත්මක විය යුතු ආකල්ප ධනාත්මකව සැලකීම තවදුරටත් සිදු නොවිය යුතු අතර එය සිසුන්ගේ සමායෝජනය සදහා වැරදි ලෙස බලපානු ඇත.

***ප්‍රමුඛ පද:*** *සමාජානුයෝජනය, සදචාරය, පාසල් නිළ විෂයමාලාව, චරිතායනය, බුද්ධ ධර්මය විෂය.*

[1] භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය *dhammaampe@gmail.com